විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය

(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - SINH – E2025

## සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය

පළමු කොටසින් ප්‍රශ්න දෙකක් හා දෙවන කොටසින් ප්‍රශ්න තුනක් ද අයත්වන සේ ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි        කාලය : පැය 03 යි

---

### I කොටස

01. ''මිනිසාගේ සියලුම ද්‍රව්‍යමය නිෂ්පාදන භෞතික සංස්කෘතියට අයත් වේ.'' මේ ප්‍රකාශයට එකඟ විය හැකිද'යි විමසන්න.

02. ''සංස්කෘතිය වෙනස් වන සුලුය'' විභාග කරන්න.

03. දේශීය ජන ජීවිතය පිළිබඳ හැදෑරීමේ දී සිංහල ජනකතාවෙන් කවර පිටුබලයක් ලද හැකි දැයි සනිදර්ශනව සාකච්ඡා කරන්න.

04. ප්‍රස්තාවපිරුළුවල අන්තර්ගත සාම්ප්‍රදායික දැනුම පිළිබඳ විමර්ශනයක් කරන්න.

05. ''ජනකවියා යශෝධරාවගේ චරිතය නිරූපණය කොට ඇත්තේ පතිභක්තියෙන් අනූන ගැමි කාන්තාවක වශයෙනි.'' මේ ප්‍රකාශය යුක්තියුක්තද'යි විභාග කරන්න.

### II කොටස

06. සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ පවත්නා මත සමාලෝචනය කරන්න.

07. සිංහල භාෂාවේ විද්‍යමාන අනාර්ය භාෂා ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

08. ව්‍යාකරණානුගත ලිංග භේදය හා අර්ථානුගත ලිංග භේදය යනු කුමක්දැයි හඳුන්වා සිදත් සඟරාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

09. ''ක්‍රියාව හා කාරක අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය අර්ථ සම්පන්න වාක්‍යයක මූලික ලක්ෂණය වෙයි.'' විමසන්න.

10. සිංහලයේ අනාගත කාල ක්‍රියා රූප පිළිබඳ සිදත් කතුවරයාගේ ඉගැන්වීම් විමසුමට ලක් කරන්න.

*******************************